# ස්ථාපිත උරුම කතිකාවත තුළ ශ්‍රී ලංකාවේ පෞරාණික ජීවමාන සිද්ධස්ථාන සංරක්ෂණයේ දී ඇතිවන ගැටළු

ෂයාමල් ඉරෝෂණ[1]

මානව වර්ගයාගේ ක්‍රමික අධ්‍යාපනයේ සහ දැනුම සම්ප්‍රේෂණයේ ප්‍රතිඵලයක් ලෙස මානව සංහතිය සතු අඛණ්ඩ ඒකාබද්ධ ක්‍රියාකාරකම් සංස්කෘතිය ලෙස ගොඩනැගේ. මේ තුළ අධ්‍යයන, අධ්‍යාපනය, භාෂාව, ඇදහිලි, සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර, සම්ප්‍රදායයන්, කලාශිල්ප, කලාකෘති, ජනශ්‍රැති සංකේත, උත්සව ආදී සියල්ල ම ඇතුළත් වේ. ක්‍රමික ව වර්ධනය වූ මානවයාට උක්ත සියලු දෑ අවට පරිසරය තම අවශ්‍යතා අනුව නිර්මාණය කරගැනීම සඳහා විශාල ලෙස උපයෝගී වන්නට ඇත. මෙවැනි සංස්කෘතියක් ගොඩනැගීමේ දී ඒ තුළ යම් ආවේණිකත්වයක් ගොඩනැගෙන අතර එයට එම සංස්කෘතිය ගොඩනැගෙන සමාජයේ දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික යන ප්‍රධාන කරුණු තීරණාත්මක භූමිකාවක් ඉටුකරන්නට ඇත.

ඉහතින් සඳහන් කරන ලද සංස්කෘතිය ගොඩනැගීමේ දී එම මානවයාගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් ශේෂ වූ යම් යම් සාධක වර්තමානය දක්වා පැවතෙන්නේ නම් ඒවා එම සමාජය නැතහොත් රට සතු ජාතික උරුමයන් බවට පත් වේ. ශ්‍රී ලංකාව වූ කලි වසර දෙදහස් පන්සියයකට අධික ඉතිහාසයක සිට ගොඩනැගී අද දක්වා ම පැවතෙන පෞරාණික ජීවමාන බෞද්ධ උරුමයන් දසදහසකට අධික ප්‍රමාණයකට හිමිකම් කියන රටකි. වර්තමානය දක්වා මෙම උරුමයන් පැවතෙන්නේ ද විවිධ මානව, භෞතික හා පාරිසරික බලපෑම් යටතේ ය. එලෙසින් පැවතෙන උරුමයන් විවිධ ස්වරූපයෙන් පවතින අතර ඒවා භෞතික වස්තූන් මෙන් ම අභෞතික සිතුම් පැතුම්, සිරිත් විරිත්, සම්ප්‍රදායයන්, පූජාවිධි, හැඟීම් ආදී ලෙස ඉස්මතු ව පෙනේ. මෙම අභෞතික දෑ ස්පර්ශ කළ නො හැකි වන අතර එය මිනිස් සිත්සතන් තුළ ස්වීයව උපදින එක්තරා සුවිශේෂී උරුමයක් ද වේ.

එහෙත් ස්ථාපිත උරුම කථිකාවත තුළ උක්ත ප්‍රස්තුතයන්ට පුරාවිද්‍යාත්මක සංරක්ෂණයේ දී ගෙන දෙනුයේ අතිවිශාල ගැටළුවකි. මෙම ස්ථාපිත උරුම සංරක්‍ෂණ කතිකාවත තුළ අඩංගුවන්නේ හුදු යුරෝපීයයන්ගේ පෞරාණික හා කලාත්මක ගොඩනැගිලි ආරක්‍ෂාකර ගැනීම සඳහා නිර්මාණය කරගත්තා වූ

[1] පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කැළණිය විශ්වවිද්‍යාලය.

කථිකාවතක අන්තර්ගතයන් මිස ජීවමාන උරුම සංරක්ෂණයට මගපාදන කරුණු නොවේ.

මේ නිසා ම වසර දෙදහස් පන්සියයකට අධික කාලයක් තිස්සේ ශිෂ්ටාචාර ගත වූ ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික උරුමයන් සංරක්ෂණයේ දී පුරාවිද්‍යාඥයා ගැටලු රැසකට මුහුණ දේ. එහි දී ඔහු මුහුණදෙන ප්‍රධාන ගැටලු ව වන්නේ ජීවමාන උරුමයක් සංරක්ෂණයේ දී ස්ථාපිත උරුම කථිකාවත තුළ අඩංගු අජීවී උරුමයන් සංරක්ෂණය උදෙසා ලොවට හඳුන්වාදෙනු ලැබූ සංකල්පයන් කෙසේ මේ තුළ ක්‍රියාත්මක කරන්නේ ද? යන්න වේ. දෙවන කරුණ වන්නේ ස්ථාපිත උරුම සංරක්ෂණ කථිකාවතේ අඩංගු නොවන එහෙත් ශ්‍රී ලංකාවේ ජීවමාන බෞද්ධාගමික උරුමස්ථානවල භාවිතවන්නා වූ අස්පර්ශනීය උරුමයන් සංරක්ෂණය කරනු ලබන්නේ උක්ත කථිකාවතේ කුමන අන්තර්ගතය මූලික කොටගනිමින් ද? නැතහොත් කුමන ක්‍රමවේදයකින් ද? යන්න වේ.

එබැවින් ස්ථාපිත උරුම කතිකාවත තුළ ශ්‍රී ලංකාවේ ජීවමාන පෞරාණික බෞද්ධ උරුම පුරාවිද්‍යාත්මකව සංරක්ෂණයේ දී ඇතිවන ගැටළු පිළිබඳව දීර්ඝව, ශ්‍රී ලංකාවේ සුවිශේෂී ජීවමාන පෞරාණික බෞද්ධ උරුම කිහිපයක් ප්‍රස්තුත කොටගෙන මෙම කථිකාවත තර්කානුකූල ව ගොනු කිරීමට මෙම පත්‍රිකාව තුළින් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පදඃ ස්ථාපිත උරුම කතිකාවත, ජීවමාන සිද්ධස්ථාන, සංරක්ෂණය, ගැටළු

**Title:** Problems on Religious Monument Conservation in the discourse of Ancient Heritage

**Keywords:** Monument conservation, Heritage Management, problems